ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී උපාධි තෙවන වසර ප්‍රථම අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2018 අගෝස්තු/සැප්තැම්බර්

ආර්ථික විද්‍යාව

**ECON 3151.03 – රාජ්‍ය ආර්ථික විද්‍යාව**

කාලය පැය (03) තුනයි

ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) වෙළෙඳපොළ ආර්ථිකයක ප්‍රධාන ලක්ෂණ මොනවාද?

**(ලකුණු 08 යි)**

(ii) වෙළඳපොළ ආර්ථිකයක ආර්ථික කටයුතු සම්බන්ධයෙන් රජය මැදිහත් විය යුත්තේ මක් නිසාදැයි පැහැදිලි කරන්න.

**(ලකුණු 08 යි)**

02. (i) පරිසර දූෂණය මුළුමනින්ම ඉවත් කළ යුතුද? එසේ නම් ඒ ඇයි? නොඑසේ නම් කොපමණ ප්‍රමාණයක පරිසර දූෂණයකට ඉඩ දිය යුතුද? තෝරාගත් නිදසුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

**(ලකුණු 08 යි)**

(ii) පරිසර දූෂණ ගැටලුව සඳහා නිර්දේශ කොට ඇති විසඳුම් දෙකක් විස්තර කරන්න.

**(ලකුණු 08 යි)**

03. "රජයේ කාර්යභාරය (Role of the state) පිළිබඳව පුළුල් වශයෙන් ව්‍යාප්ත වූ විවිධ අදහස් දක්නට ඇත". මෙම ප්‍රකාශය පැහැදිලි කොට සාකච්ඡා කරන්න.

**(ලකුණු 16 යි)**

04. (අ) බදු පැනවීමේ අරමුණු මොනවාද?

**(ලකුණු 04 යි)**

(ආ) පහත දැක්වෙන බදු අනුපාතික ව්‍යුහයන් පැහැදිලි කරන්න.

(i) සමානුපාතික

(ii) අනුක්‍රමික

(iii) ප්‍රතික්‍රමික

(ලකුණු 09 යි)

(ඉ) බදු අනුකූලතාවය (Tax compliance) යන්නෙන් කුමක් අදහස් වේද?

(ලකුණු 03 යි)

05. සුදුසු රූප සටහනක් ඇසුරින් චක්‍රාකාර ප්‍රවාහය සහ බදුකරණය අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න.

(ලකුණු 16 යි)

06. (i) බද්දක අධිබර (අතිරික්ත බර) ඔබ නිර්වචනය කරන්නේ කෙසේද?

(ලකුණු 08 යි)

(ii) අධි බදුබර තීරණය කරන සාධක මොනවාද?

(ලකුණු 08 යි)

07. (i) විමධ්‍යගතකරණය යනු කුමක්ද?

(ලකුණු 08 යි)

(ii) විමධ්‍යගතකරණයේ වාසි සහ අවාසි පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

වාසි ලකුණු 06
අවාසි ලකුණු 02

08. (i) රාජ්‍ය වියදම් පිළිබඳ වර්ගීකරණ කවරේද?

(ලකුණු 08 යි)

(ii) නූතන රාජ්‍යයන්හි රාජ්‍ය වියදම් ඉහළ යාමට බලපා ඇති හේතු විමසන්න.

(ලකුණු 08 යි)

09. ශ්‍රී ලංකා රජයේ වසර 2018 සඳහා වූ ප්‍රධාන අයවැය යෝජනා විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 16 යි)

*************